බාලවයස්කාර අයෙකුගේ කැමැත්තෙන් වුවත් සිදුවන ලිංගික සබඳතාවයක් "ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක්" වන බව නීතියේ සඳහන් වන අතර, එවැනි අවස්ථාවකදී බාලවයස්කරුගේ කැමැත්ත සැබවින්ම අදාළ නොවේ. එය නීතියෙන් දඬුවම් ලැබෙනා වරදකි. එවැනි පසුබිමකදී එවැනි පුවතක් වාර්තා කිරීමේදීද එය හුදු ආදර සම්බන්ධතාවයක් ලෙසින් ලඝු නොකොට, එහි නියම බරපතළ භාවය පෙන්වා දෙමින් වාර්තා කිරීම මාධ්‍යයේ වගකීමකි.

එසේ ගත් විට, ලිංගික අතවර සිදුවීමක් සම්බන්ධයෙන් "මිතුරුකම ආදරයකට පෙරළී එකම කාමරයක එකම පැදුරක හිරිමල් වයසේ ජෝඩු දෙකක්" යනුවෙන් සිරස්තල යෙදීම කෙතරම් ආචාර ධර්මානුකූලදැයි නැවත නැවතත් සිතාබැලීමට සිදුවේ. විශේෂයෙන්ම මෙවැනි සිදුවීමක් භාවාතිශය හා සැහැල්ලු ආකාරයෙන් ඉදිරිපත් කිරීම ඔස්සේ, එවැනි වරදක බරපතළ භාවය සමාජයට සන්නිවේදනය නොවන්නේ නොවේද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #website #SinhalaPress #Dinamina